සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

6 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය** කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල යටින් ඉරක් අඳින ලද පදයට වඩාත් සමාන අර්ථය දෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.

01 විහඟ ගී නද දසත පැතිරිණි.

(1) මී මැසි (2) වීණා (3) කුරුලු (4) කුකුළු

02 බටහිර අහසින් සූර්යයා සමුගත්තේ ය.

(1) තාරපති (2) සක්දෙවි (3) සුළඟ (4) දිනකර

03 පන්සිය පනස් ජාතක පොත බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථයකි.

(1) ගෘහය (2) පුස්තකය (3) පත්තරය (4) සඟරාව

- අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල දී ඇති පදයට විරුද්ධ අර්ථය දෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.

04 විකසිත - (1) පිපුණු (2) මුකුලිත (3) විවෘත (4) ඇරුණු

05 වක්‍ර - (1) රවුම් (2) නැමුණු (3) ඍජු (4) දිගු

06 මිහිරි - (1) ඉමිහිරි (2) සුමිහිරි (3) අමිහිරි (4) පිවිතුරු

- අංක 07 හා 08 ප්‍රශ්නවල පිල්ලම් පිළිවෙළට නිවැරදිව යොදා ඇති වචනයට යටින් ඉරක් අඳින්න.

07 කොම්බුව සහ ඇලපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල

(1) කොටියා (2) කුඹියා (3) කොච්චි (4) කෝදුරු

08 කෙටි පාපිල්ල, කෙටි පාපිල්ල, කෙටි පාපිල්ල

(1) බුලතා (2) බුලත් (3) බුරුසු (4) බුරුම



LIVEWORKSHEETS

- **අංක 09 හා 10 ප්‍රශ්නවල දී ඇති වචනය නිර්මාණය වීමට ස්වර ව්‍යඤ්ජන නිවැරදි ව ගැළපී ඇති පිළිතුර යටින් ඉරක් අඳින්න.**

09 කෘමියා (1) ක් + ඍ + ම් + ඉ + ය් + අ (2) ක් + ඍ + ම් + ඊ + ය් + ආ

(3) ක් + ඖ + ම් + ඉ + ය් + අ (4) ක් + ඍ + ම් + ඉ + ය් + ආ

10 හැන්දැව (1) හ් + ඇ + න් + ද් + ඇ + ව් + අ (2) හ් + ඇ + න් + අ + ද් + ඇ + ව් + අ

(3) හ් + එ + න් + ද් + ඒ + ව් + අ (4) හ් + ඈ + න් + ද් + ඈ + ව් + අ

- **අංක 11 සිට 13 තෙක් ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන නිවැරදි උක්ත පදය තෝරා හිස්තැනෙහි ලියන්න.**

11 .............................................................................................. රෝගීන් සුවපත් කරති.

(1) වෛද්‍යවරයා (2) වෛද්‍යවරයෙක් (3) වෛද්‍යවරුන් (4) වෛද්‍යවරු

12 .............................................................................................. ආහාර පිළියෙල කළාය.

(1) කාන්තාවන් (2) කාන්තාවක (3) කාන්තාවක් (4) කාන්තාවෝ

13 .............................................................................................. පාරට තාර දැමුවේ ය.

(1) කම්කරුවෝ (2) කම්කරුවෙකු (3) කම්කරුවා (4) කම්කරුවන්

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල දී ඇති වාක්‍යයෙහි අනුක්ත පදය තෝරා තිත් ඉරි මත ලියන්න.**

14 දෙමාපියෝ දරුවන් ආරක්ෂා කරති. ..............................................................................................

15 ගුරුවරු අප යහමඟ යවති. ..............................................................................................

16 කිරිල්ලිය ගැරඬියකු පලවා හැරියා ය. ..............................................................................................

- **අංක 17 සිට 20 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පදය අයත් පුරුෂය තිත් ඉරිමත ලියන්න.**

17 ඇය දරුවන්ට කෑම කැවුවා ය. ..............................................................................................

18 අපි සීගිරි චිත්‍ර නැරඹීමට ගියෙමු. ..............................................................................................

19 නුඹ ගමට ගියෙහි. ..............................................................................................

20 නැගණිය ගී ගයමින් නටයි. ..............................................................................................

(ලකුණු 2 x 20 = 40)



LIVEWORKSHEETS